MINISTRY OF LABOUR

# කටාර්හි රැකියා වෙනස් කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය කුමක්ද?

## කටාර් රාජ්‍යයේ සියලුම සේවකයන් හට විරෝධතා සහතිකයක් (NOC) ලබා නොගෙන සේවායෝජකයන් වෙනස් කළ හැකිය.

පහත සඳහන් පියවර 2004 අංක 14 දරණ කම්කරු නීතිය මඟින් ආවරණය වන පෞද්ගලික අංශයේ සේවකයන්ට, ගෘහස්ථ ශ්‍රමිකයන්ට, කෘෂිකාර්මික හා තෘණබිම් සේවකයන්ට සහ ධීවරයින්ට අදාළ වේ. සේවායෝජකයන් වෙනස් කිරීම සඳහා පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

### 1 සේවකයා විසින් කම්කරු අමාත්‍යාංශයේ ඉලෙක්ට්‍රොනික පද්ධතිය (MoL) හරහා රැකියා වෙනස් කිරීම සඳහා වන අයදුම්පත ඉදිරිපත් කළ යුතුය:

- සේවකයා විසින් "**සේවායෝජකයා වෙනස් කිරීම**" පෝරමය මුද්‍රණය කර, පුරවා අත්සන් කළ යුතුය. නව සේවායෝජකයා ද පෝරමය අත්සන් කර සමාගමේ නිල මුද්‍රාව එයට එක් කළ යුතුය. සේවකයා පෞද්ගලික නිවසක සේවය කිරීම සඳහා රැකියා වෙනස් කරන්නේ නම්, නව සේවායෝජකයාගේ අත්සන ප්‍රමාණවත් වේ.
- සේවකයා ඔහුගේ/ඇයගේ කටාර් හැඳුනුම්පත (QID) සහ ජංගම දුරකථන අංකය සමඟ **MoL හි ඉලෙක්ට්‍රොනික පද්ධතියට** ඇතුලත් විය යුතු අතර පසුව අත්සන් කළ පෝරමයේ පිටපතක් උඩුගත කළ යුතුය. ජංගම දුරකථන අංකය සේවකයාගේ QID වෙත සම්බන්ධ වී තිබිය යුතුය.

### 2 අයදුම්පත ඉදිරිපත් කළ පසු, EC (සේවායෝජකයා වෙනස් කිරීම) අංකයක් තිරය මත දිස්වනු ඇත. අයදුම්පත සාර්ථකව ඉදිරිපත් කල බව මෙම අංකය මඟින් තහවුරු කරයි.

- සේවකයන් විසින් EC අංකයේ වාර්තාවක් තබා ගත යුතුය.
- සේවකයන්ට ඕනෑම අවස්ථාවක ඔවුන්ගේ QID සහ EC අංකය භාවිතා කර **අමාත්‍යාංශයේ වෙබ් අඩවියට** පිවිසීමෙන් ඔවුන්ගේ අයදුම්පතේ තත්ත්වය පරීක්ෂා කළ හැකි වේ.
- **MoL හි ඉලෙක්ට්‍රොනික පද්ධතිය** හරහා, ඉල්ලීම අනුමත කිරීමට පෙර ඕනෑම වේලාවක සේවකයන්ට ඔවුන්ගේ අයදුම්පත අවලංගු කළ හැකි වේ.
- නව සේවා ගිවිසුම සත්‍යාපනය කර නොමැති තාක් කල් අනුමැතිය ලැබීමෙන් පසු MoL වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් සේවකයන්ට ඔවුන්ගේ අයදුම්පත අවලංගු කළ හැකි වේ. ඔවුන් කම්කරු සබඳතා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත අරාබි භාෂාවෙන් ලියා අත්සන් කළ ලිපියක් ඉදිරිපත් කළ යුතුය. මෙම ලිපියෙහි, ඔවුන් තම අයදුම්පත අවලංගු කරන ලෙස ඉල්ලා සිටින්නේ ඇයිදැයි යන්න පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සමඟ අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී ලබා දී ඇති EC අංකය, ඔවුන්ගේ QID හි පිටපතක් සහ ජංගම දුරකථන අංකය ඇතුළත් කළ යුතුය.

### 3 නිදසුනක් වශයෙන්, සේවකයා නිවැරදිව පෝරමය සම්පූර්ණ නොකළහොත් හෝ නව සේවායෝජකයා නව සේවකයින් බඳවා ගැනීමෙන් වැළැක්වීම වැනි අවස්ථාවල දී රැකියාව වෙනස් කිරීම සඳහා වන අයදුම්පතක් අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

### 4 අයදුම්පත් ක්‍රියාවලිය අවසන් වූ පසු, සේවකයාට රැකියාව වෙනස් කිරීමේ සහ දැනුම් දීමේ කාලසීමාව තහවුරු කරමින් අමාත්‍යාංශයෙන් කෙටි පණිවුඩයක් ලැබෙනු ඇත.

වත්මන් හා නව සේවා යෝජකයන්ට දැනුම් දෙනු ලබන්නේ මෙම අවස්ථාවේදීය.

- සේවකයා වත්මන් සේවායෝජකයා සඳහා වසර 2 ක් හෝ ඊට අඩු කාලයක් සේවය කර ඇත්නම් දැනුම් දීමේ කාලය මාසයකි.
- සේවකයා වසර 2 කට වැඩි කාලයක් සේවය කර ඇත්නම් දැනුම් දීමේ කාලය මාස දෙකකි.
- දැනුම් දීමේ කාලසීමාවේ අවසානය අමාත්‍යාංශයෙන් ලැබෙන කෙටි පණිවුඩයේ සඳහන් වේ.
- සේවකයා සහ වත්මන් සේවායෝජකයා දැනුම් දීමේ කාලසීමාව අඩු කිරීමට අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී නොමැති නම්, දැනුම් දීමේ කාලය තුළ සේවකයා වත්මන් සේවායෝජකයා සමඟ දිගටම වැඩ කළ යුතුය.

### 5 දැනුම් දීමේ කාලය අවසන් වූ පසු නව සේවායෝජකයා විසින් බහු භාෂාමය සේවා ගිවිසුමක් සඳහා MoL හි ඩිජිටල් සත්‍යාපන පද්ධතිය හරහා සේවා ගිවිසුම සකස් කරනු ඇත.

මෙය සේවකයාගේ දැනුම් දීමේ කාල සීමාව අවසන් වී මාස තුනක් ඇතුලත සිදු කල යුතුය. සියලු තොරතුරු පිරවීමෙන් පසුව නව සේවායෝජකයා විසින් සේවකයා සහ නව සේවායෝජකයා විසින් අත්සන් කළ යුතු සේවා ගිවිසුම මුද්‍රණය කරනු ඇත. සේවකයා ගිවිසුමේ විධිවිධානවලට එකඟ වන්නේ නම්, ඔහුට/ඇයට එය අත්සන් කළ හැකිය.

- නව සේවායෝජකයා විසින් අත්සන් කරන ලද ගිවිසුම සත්‍යාපනය කිරීම සඳහා අමාත්‍යංශයේ වෙබ් අඩවියට උඩුගත කරනු ඇත.
- සමාලෝචනයකිරීමෙන් පසුව නව සේවායෝජකයා විසින් සහතික කළ සේවා ගිවිසුමේ පිටපතක් සේවකයාට ලබා දිය යුතුය.

### 6 සේවා ගිවිසුම සත්‍යාපනය කිරීමෙන් පසු නව සේවායෝජකයා විසින් සේවකයාගේ නව QID සඳහා ඉල්ලීමක් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතුය.

### 7 සේවකයාට දැන් ඔහුගේ/ඇයගේ රැකියාව ආරම්භ කල හැකිය.

සේවකයාට නව QID එකක් (නොමිලේ) නව සේවායෝජකයාගෙන් ලැබෙනු ඇත.

## සටහන

සේවකයන්ට සහ සේවායෝජකයන්ට සෑම විටම සේවා ගිවිසුමේ පිටපතක් **MoL ද්වාරය** හරහා බාගත කළ හැකිය.

## ප්‍රයෝජනවත් සබැඳි

රැකියා වෙනස් කිරීම සඳහා ඔබගේ අයදුම්පත ඉදිරිපත් කරන්න

ඔබගේ සේවායෝජකයා වෙනස් කිරීමේ අයදුම්පතේ තත්වය පරීක්ෂා කරන්න

MoL වෙත කම්කරු-සම්බන්ධ පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න

## මට වැඩිදුර තොරතුරු සොයාගත හැක්කේ කොතැනින්ද?

වැඩි විස්තර සඳහා කරුණාකර **40288101** ක්ෂණික ඇමතුම් අංකයෙන්, info@mol.gov.qa, විද්‍යුත් තැපෑලෙන්, www.mol.gov.qa වෙබ් අඩවියෙන් කම්කරු අමාත්‍යාංශය හා සම්බන්ධ වන්න. නැතහොත් අපගේ කාර්යාල වෙත පිවිසෙන්න.